# කිරලකැලේ තෙත් බිම ආශ්‍රිත පාරිසරික සංචාරක කර්මාන්තයේ විභවතා

## දීර්ඝ සාරාංශය

ඒ. එම්. නිමාලි දිනේෂා අත්තනායක[2]

### හැඳින්වීම

මෑත කාලීනව සංචාරක ක්ෂේත්‍රයේ දියුණු වෙමින් පවතින අංශයක් ලෙස පාරිසරික සංචාරක ව්‍යාපාරය හෝ "විකල්ප සංචාරක ව්‍යාපාරය" කැපී පෙනෙන ක්ෂේත්‍රයක් බවට පත් වී ඇත. ඒ අනුව මූලික වශයෙන් අවධානයක් යොමු කළ යුතු ක්ෂේත්‍රයක් ලෙස සංචාරකයින්ගේ නිබඳ ඇස ගැටීමකට ලක් වන පාරිසරික පද්ධති හඳුනා ගත හැකි ය. තෙත් බිම් පරිසර පද්ධතිය ද මෙලෙස පාරිසරික සංචාරක කර්මාන්තය පාදක කරගත් පරිසර පද්ධතියක් ලෙස හඳුනාගත හැකි ය.

පෘථිවි ගෝලය තුළ භෞතික පරිසරයේ ජෛව විවිධත්වයෙන් සුපෝෂිත ජීවීන්ට සුවිශේෂී වාසභූමි සපයන, මිනිසාගේ සමාජ, ආර්ථික පරාමිතීන්ට වටිනාකම් රැසක් දායාද කරනු ලබන පාරිසරික පද්ධතියක් ලෙස තෙත් බිම් පරිසර පද්ධතිය හඳුනා ගත හැකි ය. මාතර නගරයට ආසන්නව ග්‍රාමසේවා වසම් 11ක හෙක්ටයාර් තුන්සියක් පමණ භූමි ප්‍රමාණයක් තුළ නිල්වලා ගං මෝයට කිලෝ මීටර් 6.4 දුරකින් ව්‍යාප්ත වී ඇති කිරලකැලේ තෙත්බිම් පරිසර පද්ධතියල දක්ෂිණ ශ්‍රී ලංකාවේ හෙලෝසින සමුද්‍ර විපර්යාස කාලවකවානුවට අයත් ජෛව විවිධත්වයකින් අනූන වගුරු බිමකි. *(මනෝරි 2011)* තෙත් බිම් පරිසර පද්ධතිය තුළ පවත්නා වූ සුවිශේෂි වැදගත්තමක් වනුයේ තෙත්බිම් ආශ්‍රිතව සම්පත්වල පවත්නා වූ විභවතාවයක් හඳුනා ගත හැකි වීමයි. ඒ තුළ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් එහෙත් ඵලදායිතාවයෙන් යුක්ත සම්පත් රාශියක් පැවතිම හේතුවෙන් එම තෙත්බිම් සංවර්ධනය අනාගත ඉලක්කය විභව සම්පත්වල පදනමයැයි පැවසිය හැකි ය. කිරල කැළේ තෙත් බිම පරිසර පද්ධතිය පාරිසරික සංචාරක කර්මාන්තය කෙරෙහි විභවතාවයන් පවතින තෙත්බිම් පරිසර පද්ධතියක් ලෙස හඳුනා ගත හැකි ය.

### අරමුණු

මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ පාරිසරික සංචාරක කර්මාන්තය කෙරෙහි පවත්නා විභවතාව පරීක්‍ෂා කිරීම සහ පාරිසරික සංචාරක කර්මාන්තය පවත්වාගෙන යාමට බලපෑ හැකි සංරෝධතා හඳුනා ගැනීමයි. කිරල කැළේ තෙත්බිම් පරිසර පද්ධතිය තුළ පවතින ජෛව විවිධත්වය සම්බන්ධ වර්තමාන සංවර්ධන සැලසුම් පරික්ෂා කිරීම හා ඒවායේ දුර්වලතා අධ්‍යයනය කිරීම යි, කිරල කැළේ තෙත් බිමෙහි පවතින කඩොලාන වෘක්ෂලතා ආදිය කෙරෙහි මිනිසාගේ බලපෑම කෙබඳු තත්ත්වයක පවතී ද යන්න අධ්‍යයනය කරමින් තිරසාර පරිසර සංචාරක කර්මාන්තයක් ලෙස පෙන්නුම් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම ආදිය සෙසු අරමුණු වේ.

### ක්‍රමවේදය

කිරල කැළේ තෙත් බිම් පරිසර පද්ධතියේ පාරසරික සංචාරක කර්මාන්තයේ පවතින්නා වූ විභවතාව පරික්ෂා කිරීම සහ ගැටලු අධ්‍යයනය කිරීමේදී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය පාදකකර ගන්නා ලදී. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මෙන්ම සෘජු නිරීක්ෂණය, ප්‍රශ්නාවලී ඉදිරිපත් කරමින් නිවැරදි දත්ත ලබා ගැනීම සිදුකරන ලදී. ද්විතීයික මූලාශ්‍රය ලෙස පාරිසරික පද්ධතිය හා බැඳුණු සංචාරක කර්මාන්තය පිළිබඳ ලියැවුණු පොත් සඟරා අන්තර්ජාල ආදිය මඟින් දත්ත සහ තොරතුරු එක් රැස් කර ඇත.

භූගෝලීය තොරතුරු පද්ධතියට අදාළ උපකරණය භාවිත කරමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. ඒ සඳහා පර්යේෂණයට අදාළ තිහගොඩ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකට අයත් තෙත් බිමට ආසන්න ග්‍රාම නිළධාරී වසම් එකොළහකින් වසම් පහක් තෝරා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

### ප්‍රතිඵල සාකච්ඡාව

කිරල කැළේ තෙත්බිම තුළ කඩොලාන කිරල ශාක, ආක්‍රමණශීලී ශාක හා පක්ෂි විශේෂයන් හඳුනාගත හැකි ය. අද වන විට කිරල ශාක ව්‍යාප්තිය සීමිත ප්‍රදේශයකට සීමා වී තිබීම හඳුනාගත හැකි ප්‍රධානත ම ගැටළුවකි. එසේම ඉඩම් ගොඩ කිරීම, දර ලබා ගැනීම සහ අපවිත්‍ර ද්‍රව්‍ය කිරල කැළේ තෙත් බිම් හරහා ප්‍රධාන ඇළ මාර්ගයට එක් වීම හේතුවෙන් තෙත් බිම් ප්රදේශය දූෂිත ප්‍රදේශයක් බවට පත්ව ඇත. ලවණීකරණය වැඩි වීමෙන් ශාක වර්ග මෙන්ම ජලජ ජීවීන් ද මහා පරිමාණයෙන් විනාශ වී ඇත. නිල්වලා ගංවතුර වැළැක්වීමේ ව්‍යාපාරයෙන් පසුව මෙම ප්‍රදේශයේ ඉඩම් කැබලි කර ජනතාවට වගා කිරීමට ලබා දීම, ශාක ප්‍රජාව කපා විනාශ කිරීම, හොර මත්පැන් ජාවාරම්කරුවන් විසින් ගිනි තැබීම් නිසා ද ජෛව විවිධත්වයට හානි සිදු වී ඇත. 2016 ක්ෂේත්‍ර නිරීක්ෂණයට අනුව ආක්‍රමණශීලි ශාකයක් වූ ඇකේෂියා ගස් ව්‍යාප්තිය 6000ප$^2$ පමණ වේ. වැඩුණු පදුරු ශාක පන් වර්ග ඇතුළු ජලජ ශාක නිසා කිරල කැළේ මධ්‍ය ප්‍රදේශය ජලාශ්‍රිත පක්ෂීන්ට සහ සතුන්ට සුදුසු පරිසරයක් ලෙස පැවතුණි. නිල්වලා යෝජනා ක්‍රමය මුල් කරගෙන කිරල කැළේ තෙත්බිම හා ඒ ආශ්‍රිත වගා බිම් මේ වන විටත් කිසිදු කටයුත්තකට ගත නොහැකි තත්ත්වයකට පත්ව ඇත *(මනෝරි 2010).* පාරිසරික සංචාරක කර්මාන්තයට සුදුසු විභවතාවන් එම ස්ථානයේ පවතින බවට එමඟින් තහවුරු වී ඇත. ඔවුන්ගේ අපේක්ෂාව වනුයේ තෙත්බිමේ භූමියෙහි ජලය යනාදිය ප්‍රයෝජනයට ගෙන පාරිසරික සංචාරක ව්‍යාපාරය තුළ අලෙවිකරණය සඳහා ඉඩ ලබා ගැනීමයි. ඒ සඳහා පරිසර හිතකාමී සංචාරක කර්මාන්ත යෙදවීම මඟින් අපේක්‍ෂිත අරමුණු කරා පහසුවෙන් ළඟා විය හැකි ය. නමුත් ඒ සඳහා රේඛීය ආයතන අතර පවතින සබඳතාව බිදවැටී තිබේ.

---

[2] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය රුහුණු විශ්ව විද්‍යාලය මාතර ශ්‍රී ලංකාව .

**සාරාංශය**

මෙම ක්ෂේත්‍ර නිරීක්ෂණයෙන් සිදු කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵලවලට අනුව එළැඹිය හැකි නිගමනය වන්නේ මාතර නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පාරසරික නිකේතයක් ලෙස කිරල කැළේ තෙත්බිම විවිධ ව්‍යාපෘති සඳහා යොමු කර තිබුණ ද එකී සියලුම ව්‍යාපෘති අසාර්ථක සැලසුම් ලෙස පවතී. නමුත් මධ්‍යස්ථ සම්පත් විභවතාවයන් පවතින කිරල කැළේ තෙත්බිම් මනා සැලසුම්කරණයක් සිදුකර ප්‍රදේශවාසීන් ද දැනුවත් කිරීමෙන් පාරසරික සංචාරක කර්මාන්තය පවත්වා ගෙන යාමට හැකි බව මෙම පර්යේෂණයෙන් තහවුරු වේ. මෙහිදී ඉදිරිපත් කළ හැකි යෝජනා ලෙස තෙත්බිම හා සම්බන්ධිත පාරිසරික සංචාරක කර්මාන්තය පිළිබඳ දැනුම අනාගත පරපුරට දයාද කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම කළ යුතු වේ. පාරිසරික සංචාරක කර්මාන්තය සැලසුම් සහගත කිරල කැළේ තෙත්බිම් පරිසර පද්ධතියට හානි නොවන පරිදි සංවර්ධනය කළ යුතු වේ.

**මූඛ්‍ය පද**

කිරල කැළේ, පරිසරය, සංචාරක කර්මාන්තය, තෙත්බිම්, ජෛව විවිධත්වය

**ආශ්‍රිත ග්‍රන්ථ**

බන්දු. අ. පි., 1993, ජුලි, අඩක් දත් අය නිසා සහමුලින් ම වැනසී යන දකුණු පළාතේ කලපු, විදුසර විද්‍යා සඟරාව, උපාලි ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

*සබරගමු විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය, සබරගමුව විශ්ව විද්‍යාලය, බෙලිහුල්ඔය, 2011.*

හේවගේ, ධම්මික 2008, නිල්වලා ගඟ ආශ්‍රිත ජනශ්‍රැති, මාතර වංශය, කොළඹ, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය.

Journal of the Sri Lanka Association of Geographers, Vol. 1, Sri Lanka Association of Geographers, 2010'

Nirmala.B.A.M., 2010, Examination of the potentiality of eco-tourism in the area of Kirala Kelle wetland, in Department of Geography, 3rd National Geography Conference, University of Ruhuna, Matara.